# කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

# සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

## ඇබෑර්තු

සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ පවතින පහත සදහන් පුරප්පාඩුව සඳහා බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සහකාර කළමණාකාර (නීති) - (MM-1-2) (මධ්‍යම මට්ටමේ කළමණාකාර) තනතුරු සංඛ්‍යාව (01)
සුදුසුකම් :

i. බාහිර අයදුම්කරුවන් සඳහා

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීති උපාධියක් ලබා තිබීම සමඟ නීතිඥ අවසාන පරීක්ෂණය සමත්ව තිබීම හෝ නීතිඥ අවසාන පරීක්ෂණය සමත් වී නීතිඥයකු ලෙස දිවුරුම් දී තිබීම සමග නීති ක්ෂේත්‍රයේ වසර 03 සේවා පලපුරුද්ද.
- කම්කරු විනිශ්චය සභා කටයුතු හා සමාගම් ලේකම් තනතුරෙහි පළපුරුද්ද ලබා තිබීම අමතර සුදුසුකමක් සේ සැලකේ.
- ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම පිළිබද මනා නිපුණත්වයක් තිබීම අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

වැටුප් පරිමානය - MM 1-2 – 2/2016 රු.54,550 – 10 x 1375 + 15 x 1910 = රු. 96,950/=
(මීට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.)

පත්වීමේ ස්වභාවය - ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත තනතුරකි.

වයස - අවුරුදු 24 - 45 අතර විය යුතුයි

සෑම ඉල්ලුම්කරුවෙක්ම

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

අයදුම්කරුවන් අදාල අධ්‍යාපනික සහතික පත්‍රවල සහ පලපුරුද්ද දැක්වෙන සහතිකවල පිටපත් සහිතව තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත (ඥාතින් නොවන දෙදෙනෙකුගේ නම ලිපිනය දුරකථන අංකය සමඟ) 2021.11.05 දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කල යුතුය. තනතුරේ නම ලියුම් කවරයේ ඉහල වම් කෙලවරෙහි සඳහන් කලයුතුවේ.දැනට රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමුකල යුතු වේ.

සභාපති
සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.
හුණුපිටිය
වත්තල.
2021-10-11